# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2118/26 - 2019 අප්‍රේල් මස 09 වැනි අඟහරුවාදා - 2019.04.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, හතරලියද්ද ජල සම්පාදන ව්‍යාපෘතියේ, වැලිවිට ජල ගබඩා ටැංකියේ ප්‍රවේශ මාර්ගය හා ජල සැපයුම් නල මාර්ගය සඳහා ඉඩම් කොටසක පරවශතා අයිතිය අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ පරවශතා අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 මාර්තු මස 29 වැනි දින,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1458

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 340, වැලිවිට ඉහළ උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බෝගස්හින්න/වැලිවිට ඉහළගම ගමේ පිහිටි, බලය ලත් මිනින්දෝරු එන්. බී. ඩී. වැත්තෑව මහතා විසින් මැන සකස් කරන ලද අංක 3243 දරන සැලැස්මේ කැබලි අංක 13 න් කොටසක් (කැබලි අක්ෂර D) වශයෙන් දැක්වෙන ''බෝගස්අන්ගේ වත්ත හෙවත් බෝගස්හින්නේ වත්ත'' නැමති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 05 ක් පමණ වන ඉඩම් කොටස.

කැබලි අංක 13න් කොටසක් (කැබලි අක්ෂර D)

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 3243 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 13 දරන ප්‍රවේශ මාර්ගයේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | අංක 3243 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 6, 7 හා 8 දරන ඉඩම් කොටස් ; |
| *දකුණට* | : | අංක 3243 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 10 දරන ඉඩම හා එම්. එම්. ටිකිරිබණ්ඩා සහ තවත් අය හිමිකම් කියන බෝගස්හින්න වත්ත ඉඩමේ කොටසක් ; |
| *බටහිරට* | : | අංක 3243 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක 13 දරන ප්‍රවේශ මාර්ගයේ ඉතිරි කොටස. |


1A - G 29850 — 50 (2019/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : 1. එච්. එම්. සුමේධ සෙනවිරත්න මහතා,
බෝගස් හින්න වත්ත,
සංඝරාජ පුර,
හතරලියද්ද.

04 - 792

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, මහනුවර උතුර - පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ, කොනකලගල නව පොම්පාගාරය ඉදි කිරීම සඳහා විකල්ප ඉඩම් කොටස් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස් හි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 මාර්තු මස 29 වැනි දින,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1459

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 581, කොනකලගල, ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කොනකලගල ගමේ පිහිටි, බලයලත් මිනින්දෝරු වී. එන්. රණසිංහ මහතා විසින් මැන සකස් කරන ලද අංක 14/20 දරන බලයලත් මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක "A" හා "B" වශයෙන් දැක්වෙන ''කින්නරපැල කුඹුර'' නමැති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් පර්චස් 21ක් පමණ වන, පහත විස්තර සඳහන් ඉඩම් කොටස් දෙක.

කැබලි අක්ෂර : "A"
ඉඩමේ නම : කින්නරපැල කුඹුර
ප්‍රමාණය : පර්චස් 15.5

මායිම් :

*උතුරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ පිඹුරුපත් අංක 4227A හි කැබලි අංක 02 ;

*නැගෙනහිරට* : පිඹුරුපත් අංක 4227A හි කැබලි අංක 02 සහ ඇළ ;

*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ ඇල ;

*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස.

කැබලි අක්ෂර : "B"
ඉඩමේ නම : කින්නරපැල කුඹුර
ප්‍රමාණය : පර්චස් 5.5

මායිම් :

| | | |
|---|---|---|
| උතුරට | : | මෙම ඉඩමේ ඉතිරි කොටස සහ අත්කර ගැනීමට ඇති කැබලි අංක A ; |
| නැගෙනහිරට | : | ඇළ ; |
| දකුණට | : | ප්‍රාදේශීය සභා මාර්ගය ; |
| බටහිරට | : | මෙම ඉඩමේ ඉතිරි කොටස සහ ප්‍රාදේශීය සභා මාර්ගය |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : 1. ඒ. අයි. ජයවික්‍රම මහතා,
අංක 100, ශ්‍රී විජිත මාවත,
කොනකලගල,
අලවතුගොඩ.

04 - 833

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ඇහැලියගොඩ නව ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ජල පිරිපහදු ඒකකය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 මාර්තු මස 29 වැනි දින,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1460

**උපලේඛනය**

කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගලබලනකන්ද ග්‍රාම නිලධාරී වසමේ මානියම්ගම ගමේ පිහිටි කොබොතුරාවත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් බලයලත් මිනින්දෝරු ඒ. වෙලගෙදර මහතා විසින් සකස් කරන ලද සැලසුම් අංක 959හි දැක්වෙන අක්. 2, රූඩ්. 1, පර්චස් 20.75ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| උතුරට | : | කැබලි අංක 6A හා B (මාර්ගය) ; |
| නැගෙනහිරට | : | හොරාගිල්ලුහේන පහල කැල්ල ; |
| දකුණට | : | කැබලි අංක 08 ; |
| බටහිරට | : | බෙන්වලහේන. |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : 1. ඩී. ජේ. විජේසුන්දර මහතා,
A7/2, පින්නපොල,
මානියම්ගම,
අවිස්සාවේල්ල.

04- 834

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.